# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2020 ඔක්තෝබර් මස 02 වන දින

## II වන කොටස

## අතිරේකය

(2020.10.08 දින නිකුත් කරන ලදී)

### කර්මාන්තශාලා (සංශෝධන)

**(128 වන අධිකාරය වූ) කර්මාන්තශාලා ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

කම්කරු අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 12.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මඟින් (මෙහි මින් මතු “ප්‍රධාන ප්‍රඥප්තිය” යනුවෙන් සඳහන් කරනු ලබන) (128 වන අධිකාරය වූ) කර්මාන්තශාලා ආඥාපනතේ 67 වන වගන්තියේ (ආ) ඡේදය ඉවත් කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ තරුණ තැනැත්තන් හට දිනක් තුළ සේවයේ යෙදිය හැකි කාල සීමාව තීරණය කිරීම පුළුල් වීම වේ.

***3 වන වගන්තිය*** : මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තියේ (1) වන උපවගන්තිය සංශෝධනය කරනු ලබන අතර, ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ තරුණ තැනැත්තන්ගේ වයස පිළිබඳව පුනරාවර්තනය කිරීමෙන් වැළකීම වේ.

***4 වන වගන්තිය*** : මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තියේ (1) වන උපවගන්තිය සංශෝධනය කරනු ලබන අතර, 3 වන වගන්තිය මඟින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***5 වන වගන්තිය*** : මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 77 වන වගන්තිය ඉවත් කරනු ලැබේ.

***6 වන වගන්තිය*** : මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 86 වන වගන්තියේ (ඇ) ඡේදය සංශෝධනය කරනු ලබන අතර, 3 වන වගන්තිය මඟින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

***7 වන වගන්තිය*** : මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 127 වන වගන්තියේ (1) වන උපවගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ “තරුණ තැනැත්තකු” යන යෙදුමේ අර්ථ නිරූපණය වයස අවුරුදු දහසය සිට දහඅට අතර වන ලෙස සංශෝධනය කිරීම වේ.

එල්.ඩී.—ඕ. 35/2018

## (128 වන අධිකාරය වූ) කර්මාන්තශාලා ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

*ලුහුඬු නාමය.*

1. මේ පනත 2020 අංක    දරන කර්මාන්තශාලා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*128 වන අධිකාරයේ 67 වන වගන්තිය සංශෝධනය කිරීම.*

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (128 වන අධිකාරය වූ) කර්මාන්තශාලා ආඥාපනතේ 67 වන වගන්තියේ (ආ) ඡේදය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(ආ) තරුණ තැනැත්තන් සම්බන්ධයෙන් සේවා නියුක්ති කාලය, එක් දිනක දී පැය දොළහ නොඉක්මවිය යුතු අතර, එය පෙ. ව. 6.00 ට පෙර ආරම්භ නොවිය යුතු අතර, ප. ව. 8.00 පසුවී අවසන් නොවිය යුතු ය. තව ද, සතියෙහි එක් දිනයක සේවා නියුක්ති කාලය ප. ව. 1.00 වන විට අවසන් විය යුතු ය;".

*ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තිය සංශෝධනය කිරීම.*

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 68(1) වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) "වයස අවුරුදු දහසය සම්පූර්ණ වූ එහෙත් වයස අවුරුදු දහඅට සම්පූර්ණ නොවූ" යන වචන ඉවත් කිරීමෙන්;

(2) එම උපවගන්තියේ අතුරු විධානයේ "වයස අවුරුදු දහසය සම්පූර්ණ වූ එහෙත් වයස අවුරුදු දහඅට සම්පූර්ණ නොවූ" යන වචන ඉවත් කිරීමෙන්.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තිය සංශෝධනය කිරීම.*

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 71(1) වන වගන්තියේ අතුරුවිධානයේ "වයස අවුරුදු දහසය සම්පූර්ණ වූ" යන වචන ඉවත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 77 වන වගන්තිය ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 77 වන වගන්තිය ඉවත් කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 86 වන වගන්තියේ (ඇ) ඡේදයේ “සහ තරුණ අය පිළිබඳ සඳහන් කිරීම්වලට වයස අවුරුදු දහඅට සම්පූර්ණ නොවූ සියලු තැනැත්තන් පිළිබඳ සඳහන් කිරීම් ඇතුළත් වූයේ නම්” යන වචන ඉවත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 86 වන වගන්තිය සංශෝධනය කිරීම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 127 වන වගන්තියේ (1) වන උපවගන්තියේ “තරුණ අය” යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන්, එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

> “ “තරුණ තැනැත්තකු” යන්නෙන්, වයස අවුරුදු දහසය සම්පූර්ණ වූ එහෙත් වයස අවුරුදු දහඅටට අඩු තැනැත්තකු අදහස් වේ;”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 127 වන වගන්තිය සංශෝධනය කිරීම.

**8.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.